**ශ්‍රී ලංකා මේස පන්දු සංගමය - 2021**

**-----------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1. මතය ව්‍යාවනය**

ශ්‍රී ලංකා මේස පන්දු සංගමයේ ("සංගමය") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ප්‍රකාශනය, අරමුදල් වෙනස් වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(3) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සංගමයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මම මතයක් ප්‍රකාශ නොකරමි. මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.2 මතය ව්‍යාවනය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති පරිදි, මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් සහ වියදම් ප්‍රකාශය, හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ ඇතුළත් ප්‍රමාණාත්මක අයිතම විකල්ප ක්‍රම මගින් තහවුරු කිරීමට හෝ සත්‍යාපනය කිරීමට මා හට නොහැකි විය. මෙම කරුණුවල ප්‍රතිඵලයක් ලෙස, වාර්තාගත කළ හෝ නොකළ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ආදායම් සහ වියදම් ප්‍රකාශය, මුදල් ප්‍රවාහ වල අගයන් සහ අයිතමයන් සම්බන්ධව කිසියම් ගැලපීමක් අවශ්‍ය වේද යන්න තීරණය කිරීමට මා හට නොහැකි විය.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන සුළු හා මධ්‍ය පරිමාණ ආයතන සඳහා වූ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සංගමයේ අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සංගමය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සංගමයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සංගමයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව, සංගමයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

### 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. කෙසේවෙතත්, මෙම වාර්තාවේ 1.5 ඡේදයේ විස්තර කර ඇති කරුණුවල බලපෑම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මතයක් ඉදිරිපත් කිරීම සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

### 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

#### 1.5.1 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණ | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ලැබිය යුතු රු. 384,821 ක මුදල වසර 05 කට වැඩි කාලයක් ආපසු අයකර ගැනීමකින් තොරව සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු නොකොට ලැබිය යුතුව පැවතුනි. | මෙම ශේෂයන් පැරණි ශේෂයන් වන අතර ඒවා අනු කමිටුවක් වෙත යොමු කර ඇත. අනුකමිටුව පත් කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය. | ලැබිය යුතු මුදල අයකර ගැනීමට කඩිනම් පියවර ගත යුතුය. |
| (ආ) ගෙවිය යුතු රු. 760,820 ක මුදල වසර 05කට වැඩි කාලයක් ගෙවීමකින් තොරව සහ මූල්‍ය ප්‍රකාශනවල අවශ්‍ය ගැලපීම් සිදු නොකර හිඟව පැවතුනි. | මෙම ශේෂයන් පැරණි ශේෂයන් වන අතර ඒවා අනු කමිටුවක් වෙත යොමු කර ඇත. අනුකමිටුව පත් කිරීමෙන් පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට නියමිතය | ගෙවිය යුතු මුදල පියවීමට කඩිනම් පියවර ගත යුතුය |

#### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| අයිතමය | මුදල රු. | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| බැංකු ශේෂය | 992,022 | ශේෂය තහවුරු කිරීම් සහ බැංකු සැසඳුම් ප්‍රකාශ | මෙම ශේෂයන් පැරණි ශේෂයන් වන අතර ඒවා අනු කමිටුවක් වෙත යොමු කර ඇත. | අවශ්‍ය තොරතුරු සහ සාක්ෂි විගණනය වෙත ඉදිරිපත් කළ යුතුය. |
| ආදායම් | 6,353,161 | රිසිට්පත් | අනුකමිටු වාර්තාව ලද පසු ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කරනු ලැබේ. | |
| වියදම් | 6,360,603 | ගෙවීම් වවුචර | | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 7,442 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,152,953 ක ඌනතාවයක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 1,145,511 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයකට ප්‍රධාන හේතුව ලෙස සැලකෙන්නේ රු. 4,389,465 කින් මුළු වියදම් වැඩිවීමට සාපේක්ෂව මුළු ආදායම රු. රු 5,534,975 කින් වැඩිවීමයි.

## 3. වගවීම සහ යහපාලනය

### 3.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකරණයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2016 අංක 01 දරන ජාතික ක්‍රීඩා සංගම් නියෝග (111) කොටස 7 (xiii) වගන්තියට අනුව, සංගමය විසින් සහතික කරන ලද මූල්‍ය ප්‍රකාශන මූල්‍ය වර්ෂය අවසන් වී මාස දෙකක් ඇතුළත විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කළ යුතුය. 2021 වර්ෂය සඳහා වූ සංගමයේ මූල්‍ය ප්‍රකාශන සැලකිය යුතු ප්‍රමාදයකින් යුතුව විගණකාධිපති වරයා වෙත ඉදිරිපත් කර තිබුණි. | පිළිගනී. | ජාතික ක්‍රීඩා සංගම් නියෝග වලට අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතුය. |